## කොවිඩ් 19 සති පාසල -9 වන ශ්‍රේණිය -නොවැම්බර් දෙවන සතිය

## දත්ත නිරූපණය හා දත්ත අර්ථකථනය 1

### සංඛ්‍යාත්මක දත්ත

සංඛ්‍යාත්මක දත්ත

| සන්තතික දත්ත | විවික්ත දත්ත |
|---|---|
| පූර්ණ අගයන් පමණක් නොව දශම හා භාග අගයන් ද සහිතව ඕනෑම අගයක් ගත හැකි සංඛ්‍යා | පූර්ණ අගයන් පමණක් ගත හැකි සංඛ්‍යා |
| ඒකක වෙනස් කළ හැකිය | ඒකක වෙනස් කළ නොහැකිය |
| උදා:<br>1.තේ දළු වල ස්කන්ධය<br>2.පන්තියේ සිසුන්ගේ ස්කන්ධය<br>3.පන්තියේ සිසුන්ගේ උස | උදා:<br>1.පන්තියේ සිසුන් ගණන<br>2.පන්තියේ පුටු ගණන<br>3.ආයතනයක වැඩ කරන සේවක පිරිස |

ඔබේ පෙළ පොත ද අධ්‍යනය කර 28 – 1 අභ්‍යාසය සඳහා පිළිතුරු සපයන්න.

## සමූහිත සංඛ්‍යාත ව්‍යාප්තිය

අසමූහිත සංඛ්‍යා හෙවත් කාණ්ඩවලට වෙන් නොකරන ලද සංඛ්‍යා විශාල සංඛ්‍යාවක් ඇතිවිට දත්ත ගණනය කිරීම අපහසු බැවින්,ඒවා සමූහනය කිරීම සිදු කරයි,
ඒ සඳහා පහත ක්‍රමය අනුගමනය කරමු.

1- දත්ත වල පරාසය සෙවීම

වැඩිම අගය – අඩුම අගය = පරාසය

2- පන්ති ප්‍රාන්තර ගණන තීරණය (සමාන ප්‍රමාණ සහිත සංඛ්‍යා සමූහ පන්ති ප්‍රාන්තර වේ.)

$$\text{පන්ති ප්‍රාන්තර ගණන} = \frac{\text{පරාසය}}{\text{පන්තියක තරම}}$$ හෝ පන්ති ප්‍රාන්තර 7 සිට 12 දක්වා අගයක් ගැනීම

3- පන්තියක තරම (එක් පන්තියකට අයත් සංඛ්‍යා ගණන වේ.)

$$\text{පන්තියක තරම} = \frac{\text{පරාසය}}{\text{පන්ති ප්‍රාන්තර ගණන}}$$ හෝ පන්තියේ තරම පරාසය දෙස බලා තීරණය කිරීම

4- සංඛ්‍යාතය = පන්තියකට හිමිවන සංඛ්‍යා ගණන.

ඉහත තොරතුරු වලට අනුව පහත අසමූහිත ලකුණු වගුගත කරමු.

පාසලක සිංහල විෂයට පෙනීසිටි ළමයින් 50 ක් ලකුණු ලැබූ ආකාරය පහත දැක්වේ.
04, 12, 16, 20, 22, 25, 29, 30, 33, 35, 35, 37, 39, 41, 41, 43, 43, 43, 44, 45, 46, 48, 51, 52, 52, 52, 53, 54, 55, 55, 56, 57, 58, 59, 62, 63, 64, 65, 67, 68, 71, 74, 75, 75, 77, 81, 83, 86, 89, 95,

පරාසය = 95 – 04

= 91

පන්ති ප්‍රාන්තර ගණන 10 ක් ලෙස සිතමු.

$$\text{පන්තියක තරම} = \frac{\text{පරාසය}}{\text{පන්ති ප්‍රාන්තර ගණන}} = \frac{91}{10} = 9.1 \longrightarrow 9 + 1 = 10$$ ලෙස ගනිමු.

∴ පන්ති ප්‍රාන්තර 1-10, 11-20, 21-30, ආකාරයට 91-100 දක්වා ගනිමු.

දැන් ඉහත කරුණු ඇසුරින් සංඛ්‍යා සමූහනය කර වගුව සකසමු

| පන්ති ප්‍රාන්තරය (ලකුණු) | ප්‍රගණන ලකුණු | සංඛ්‍යාතය (f) (ළමුන් ගණන) |
|---|---|---|
| 1 – 10 | / | 1 |
| 11 – 20 | /// | 3 |
| 21 – 30 | //// | 4 |
| 31 – 40 | ~~////~~ | 5 |
| 41 – 50 | ~~////~~ //// | 9 |
| 51 – 60 | ~~////~~ ~~////~~ // | 12 |
| 61 – 70 | ~~////~~ / | 6 |
| 71 – 80 | ~~////~~ | 5 |
| 80 – 90 | //// | 4 |
| 91 – 100 | / | 1 |

$\sum f = 50$

(ඉදිරි ගණනය කිරිම් වලදී ප්‍රගණන ලකුණු තීරුව අවශ්‍ය නොවේ.)

මෙම වගුව මගින්

- දත්ත සන්නිවේදනය කිරීමේ පහසුව.
- සංඛ්‍යාත්මකව ගණනය කිරීමේ පහසුව.
- විවිධ නිගමන වලට එළඹීමේ පහසුව.

ඔබට ලැබේ.

ඔබේ පෙළ පොත ද අධ්‍යනය කර 28 – 2 අභ්‍යාසය සඳහා පිළිතුරු සපයන්න.

